**තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**-----------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව සහ විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට තිරුක්කෝවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------**

(අ) **ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු ඉඩම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම්වල දක්වා නොතිබුණි. | ඉඩම්වල වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | ඉදිරියේදි කටයුතු කරනු ලැබේ. |
| (ii) | සභාව සතු වාහන 12 ක වටිනාකම තක්සේරුකර ගිණුම්වල දක්වා නොතිබුණි. | සියළුම වාහන තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. | මෙහි වාහනවල වටිනාකම නැවත තක්සේරු කර ඉදිරියේදි ගිණුම්වලට ගැනීමට කටයුතු කරමි. |

(ආ) **විගණනය සඳයා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු. 98.096,343 ක් වටිනා ගිණුම් විෂයයන් 04 කට අදාල ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛන, සමීක්ෂණ මණ්ඩග වාර්තා, අත්තිකාරම් ලේඛණ ආදී තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ සනාථ කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයෙන් වෙන්කර ගත් ඒවාය. ඒවාට අදාල ලේඛනමය සාක්ෂි ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

| | නීති, රීතිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ දෙකක් ඉක්මවූ රු.204,744 ක් වටිනා කල් ඉකුත්වූ තැන්පත් 26 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | මේ සියල්ල 2020 වර්ෂයේ අවසන් ගිණුම්වල නිවැරදි කරමි. |
| (ආ) | නාගරික සංවර්ධන අධිකාරියේ 1993 නොවැම්බර් 18 දින අංක 15 දරන චක්‍රලේඛය | නාගරික සංවර්ධන යන නමින් බැංකු ගිණුමක් ආරම්භ කර තිබූ නමුත් පසුගිය වර්ෂ 5 තුල ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධයෙන් සේවා ගාස්තු සහ දඩ මුදල් එම ගිණුමේ තැන්පත් නොකර සභාවේ ක්‍රියාකාරි බැංකු ගිණුමක තැන්පත් කර වියදම් කර තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | නාගරික සංවර්ධන සම්බන්ධව සේවා ගාස්තු නාගරික සංවර්ධන ගිණුමේ තැන්පත් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,710,792 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,932,720 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 9,000 | 610 | 610 | 2,110 | 13,500 | 4,000 | 9,110 | 2,112 |
| කුලී | 3,735,000 | 5,015,021 | 5,330,766 | 2,158,397 | 3,425,000 | 3,850,642 | 3,928,518 | 2,474,142 |
| බලපත්‍ර ගාස්තු | 725,000 | 674,845 | 682,075 | -- | 667,500 | 697,410 | 708,135 | 7,230 |
| වෙනත් ආදායම් | 9,316,000 | 9,685,188 | 9,685,188 | -- | 4,216,000 | 11,362,572 | 11,362,572 | -- |
| | **13,785,000** | **15,375,664** | **15,698,639** | **2,160,507** | **8,322,000** | **15,914,624** | **16,008,335** | **2,483,484** |

### 2.2.2 කුලී

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | හිඟ කුලී ආදායම් රු. 895,315 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් නිසි කාලයේදී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි නීතියානුකූලව කටයුතු කිරීමට තීරණය කර ඇත. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට හිඟ බදු කුලී රු.1,263,082 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයකර නොතිබුණි. | හිඟ ආදායම් නිසි කාලයේදී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | මස් කඩ හිඟ බදු කුලී සම්බන්ධයෙන් නීතියානුකූලව කටයුතු කර නොහැකි අතර අනෙකුත් හිඟ මුදල් සමථ මණ්ඩලයට පැමිණිලි කිරීමෙන් පසු අයවෙමින් පවති. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධන

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විවරණය, පහසුව හා සුභසාධන යන සභාව විසින් ඉටුකළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කරීම් පිළිබඳව අනාවරණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත් 126 වගන්තිය අනුව, ප්‍රාදේශීය සභාවේ ආදායම් විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස්කර ක්‍රියාත්මක කළයුතු වුවද, එක් කාරණාවක් සම්බන්ධයෙන් පමණක් අතුරු ව්‍යවස්ථා සකස්කර තිබුණි. | සභාවට අදාල කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සකස්කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සකස්කිරීම සම්බන්ධයෙන් 2019 මැයි මස සභා වාරයේ සාකච්ඡා කර ඇත. සුදුසු අතුරු ව්‍යවස්ථා සකස්කරන බවත් පනවන ලද අතුරු ව්‍යවස්ථා වලට අදාල වෙනස්කම් කර ගැසට්පත්‍රයේ පළ කිරීමට කරමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කළ යුතුවේ. | දැනට 2020 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් සකස්කිරීමට කටයුතු කර ඇත. |

(ඇ) තිරිසාර සංවර්ධන ඉලක්ක

----------------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) තිරසාර සංවර්ධනය මැනීමට දර්ශක සකස්කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන එය මැනීම් සඳහා දර්ශක සකස්කළ යුතු අතර එය ලඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | මැනීමට අවශ්‍ය දර්ශක ඉදිරියේදි සකස් කිරීමට කටයුතු කරමි. |
| (ii) 2017, 2018 සහ සමාලෝචිත වර්ෂයේ තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සභාව විසින් හඳුනා ගෙන නොතිබුණි. | ඉලක්ක හඳුනාගෙන එය ලඟා කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන කළ යුතු වේ. | ඉලක්ක හඳුනාගෙන එය සඳහා මුදල් ප්‍රතිපාදන කිරීමට කටයුතු කරමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හා වෙනත් සංවිධාන වලින් ලැබී වසර 04 සිට වසර 13 ක් දක්වා පාවිච්චිකල වාහන 05 ක් සහ ට්‍රේලර් 02 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා වාහන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි නිවැරදි කර සභාවේ නමට අයිතිය පවරා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2017 වර්ෂයේදී ප්‍රාදේශීය සභා සවිමත් කිරීමේ වැඩ සටහන යටතේ විනායකපුරම් බස් නැවතුම් පොළ ඉදිකිරීමේ කර්මාන්තය සඳහා රු.167,000 ක ඇස්තමේන්තුවක් මත රු.76,165 ක් වැය කර තිබූ නමුත් මාර්ග සංවර්ධන අධිකාරියට අයිති මායිමේ ඉදිකිරීම නිසා අදාල කර්මාන්තය නිම කල නොහැකිව තිබුණි. | අදාල වැඩ අවසන් කර මහජනතාවගේ ප්‍රයෝජනයට ලබාදිය යුතු වේ. | මෙම බස් නැවතුම් පොළට අදාල ඉතිරි වැඩ කොටස 2020 වර්ෂයේ මුදල් ප්‍රතිපාදනයෙන් නිමකිරීමට කටයුතු කරමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිලධාරීන් 03 දෙනකුගේ හිඟ සේවක ණය රු.236,170 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු වාහන තවතා තැබීම සඳහා වාහන අංගනය ප්‍රමාණවත් නොවීම නිසා සහා කාර්යාල ඉදිරිපිට ඇති මාර්ගයේ අනාරක්ෂිතව නවතා තිබුණි. | වාහන ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි එයට මුදල් ප්‍රතිපාදන ලැබීම අනුව වාහන අංගනයක් ඉදි කිරීමට කටයුතු කරමි. |

**3.4.2 නිෂ්ක්‍රිය වත්කම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2017 වර්ෂයේ රුපියල් මිලියන 5 ක වියදමින් ඉදිකර තිබූ විනායකපුරම් මහජන පොල ගොඩනැගිල්ල මහජනයා අඩුවෙන් ගැවසෙන ස්ථානයක ඉදිකර තිබීමෙන් එම කඩ කාමර 02 ක් අදාල අරමුණ සඳහා යොදවා ගැනීමකින් තොරව නිෂ්ක්‍රියව තිබුණි. | සභාවේ වත්කම් ඵලදායිව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | මහජනයා භාණ්ඩ මිලදී ගැනීම සඳහා තම්බිලුවිල් මධ්‍යම වෙළඳ පොළට පැමිණීම හේතුවෙන් විනායකපුරම් පොළට පැමිණීම අඩුවෙන් පැවතුනි. කෙසේවෙතත් මහජනයා ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | තම්බිලුවිල් මධ්‍යය පොළෙහි කඩ කාමර 04 ක් වර්ෂ හයකට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | සභාවේ වත්කම් ඵලදායි ලෙස යොදවා ගත යුතු වේ. | මහල් ගොඩනැගිල්ල වෙළඳාම සඳහා සුදුසු නොවන බව වෙළඳ මහතුන් අදහස් කරන බැවින් මෙම කඩ බදු දීමට නොහැකිව ඇත. |

**4 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ නිසි පරිදි රැස්වීම් පැවත්වීමට තීරණය කර ඇත. |